සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/02/08/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ....................

දිනය / திகதி / Date: 2016.09.21

දිවිනැගුම ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2016/06

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්/ දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන්,

## 2016 ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනය අළලා ක්‍රියාත්මක කරන කැකුළු/ සිසුරක ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.

**1. හැඳින්වීම.**

දිවිනැගුම ප්‍රජාමූල බැංකු වැඩසටහනේ, ඉතුරුම් තැන්පතු ඉහළ නැංවීම අරමුණින්, 2016 ඔක්තෝම්බර් මස 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව සිසුරක/ කැකුළු ළමා ඉතුරුම් ගිණුම් ප්‍රවර්ධන සතියක් දියත් කරනු ලබයි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා තිළිණ ලබාදීම ඇතුළු කරුණු සම්බන්ධව මඟ පෙන්වීම මෙමඟින් සිදු වේ.

**2. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වෙන කාල සීමාව**

2016 ඔක්තෝම්බර් මස 01 දින සිට 09 දින දක්වා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වේ.

**3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ ඉලක්ක.**

03.01. මෙම ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ දී ඉතිරි කිරීම් සඳහා ඉලක්ක ලබාදීමේදී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

i. දරු දැරියන් සඳහා නව ළමා ගිණුම් ආරම්භ කර, ඉතුරුම් කිරීමට හුරු කිරීම.
ii. දැනටමත් ආරම්භ කර ඇති සිසුරක/ කැකුළු ගිණුම් සඳහා, තැන්පතු මුදල් රැස් කිරීම.
iii. අක්‍රීය ළමා ගිණුම් සක්‍රීය තත්වයකට නැවත පත් කිරීම.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

Desktop - Isuri- Anura- Circular

03.02. මෙම වැඩසටහනේදී, දිවිනැගුම ප්‍රජාමූල බැංකුව මෙන්ම බැංකු සමිතිය, දිස්ත්‍රික්ක හා ජාතික මට්ටම දක්වා, ඒ ඒ අංශ විසින් ඉලක්ක සකස් කර, සපුරා ගත යුතුය. දිවිනැගුම ප්‍රජාමූල බැංකු මඟින් වසම් සඳහාද ඉලක්ක ලබාදීම සිදු කල යුතුය.

03.03. එක් එක් දිවිනැගුම ප්‍රජාමූල බැංකුව විසින් අවම වශයෙන් නව ළමා ගිණුම් 50ක් ආරම්භ කිරීමට සැලසුම් කල යුතුය. අළුතින්ම ආරම්භ කරන හා දැනට පවතින ළමා ගිණුම් සඳහා තැන්පතු අවම වශයෙන් රු.300,000 රැස් කල යුතුය. එසේ වුවද යම් බැංකු බල ප්‍රදේශයකට අයත් ග්‍රාම වසම් ගණන 10ට අඩු අවස්ථාවක එක් වසමකට නව ළමා ගිණුම් අවම 4 බැගින්ද, එක් වසමකට ළමා තැන්පතු අවම ඉලක්කය රු.25,000/- බැගින් සකස් කර ගත හැක. එහිදී සමස්ථ බැංකුවෙහි ඉලක්කය වසම් ගණන අනුව තීරණය කර ගත හැක.

03.04. දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය විසින් තම බල ප්‍රදේශයේ පිහිටි සමස්ථ බැංකුවල ඉලක්කවල වන එකතුව බැංකු සමිතියේ ඉලක්කය විය යුතුය. එම ඉලක්කය ඉක්මවා නව ගිණුම් ආරම්භ කිරීම හා තැන්පතු රැස් කිරීමට අවශ්‍ය සහාය බැංකු සඳහා දිය යුතුය.

03.05. එක් එක් දිස්ත්‍රික්කයේ ඉලක්කය ලෙස තම දිස්ත්‍රික් බල ප්‍රදේශයේ පිහිටි බැංකු සඳහා දී ඇති ඉලක්ක සියල්ලෙහි එකතුව දිස්ත්‍රික්කයේ ඉලක්කය වේ. එම ඉලක්කය සපුරා ගැනීමට නිලධාරීන් මෙහෙයවීමට කටයුතු කල යුතුය.

**4. තිළිණ ලබාදීම හා වියදම් දැරීම.**

04.01. අදාල නිශ්චිත කාලය තුල රු.500/- හෝ ඊට වැඩි ඉතිරි කිරීම් සඳහා තිළිණය බැගින් ලබාදිය යුතුය.

එහිදී, එක් එක් බැංකුවක රැස් කරන මුළු තැන්පතු මුදලට සාපේක්ෂව 3% නොඉක්මවන මුදලක් තිළිණ සඳහා බැංකු අරමුදලින් වැය කල හැකිය. වියදම් දැරීමේදී, වැය ගිණුම - බැංකු කටයුතු ප්‍රවර්ධන කටයුතු ගිණුමට හර කල යුතුය.

04.02. රු.500/- අඩු මුදලක් තැන්පත් කරන ගිණුම්හිමියන්ට රු.50/- නොඉක්මවන වටිනාකමක් සහිත මුදල් එකතු කරන කැටයක් ලබාදිය යුතුය.

එමෙන්ම, අළුතින්ම ළමා ගිණුමක් ආරම්භ කරන අවස්ථාවක රු.500 හෝ ඊට වැඩි මුදලක් ආරම්භක තැන්පතුව ලෙස තැන්පතු කරන විටක, තිළිණයට අමතර, මුදල් එකතු කරන කැටයක් ලබාදිය හැක.

04.03. තැන්පතුකරුවන්ට ලබාදිය යුතු තිළිණ තෝරා ගැනීම බැංකු පාලක මණ්ඩලයේ එකඟතාවය මත සිදුවිය යුතු අතර, එමෙන්ම තිළිණ මිලදී ගැනීම මූල්‍ය විනිවිදභාවය රැකෙන පරිදි සිදු කල යුතුය. තිළිණ සඳහා අයිතම් තෝරාගැනීමේදී බැංකුවට ප්‍රචාරණ සහයෝගයක් හා කීර්තිනාමයක් අත්පත් කර ගැනීමට හැකිවන පරිදි සිදු කල යුතුය.

04.04. ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ, ළමුන් හා දෙමව්පියන් පාසැල් දැනුවත් කිරීමට අත් පත්‍රිකාවන් හෝ බැනර් සකස් කිරීම සඳහා රු.2,000/- ක උපරිම මුදලක් බැංකු අරමුදලින් වැයකල හැක.

**5. ප්‍රගති වාර්තා ලබාදීම.**

05.01. ඇමුණුම් 01හි ආකෘතිය භාවිතා කර, බැංකුව විසින් 2016.10.19 දිනට පෙර දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතියට ප්‍රගතිය ඉදිරිපත් කල යුතු අතර, බැංකු සමිතිය ආකෘති 02 භාවිතා කර, 2016.10.25 දිනට පෙර වාර්තාව සකස් කර, දිස්ත්‍රික් දිවිනැගුම අංශයට භාර දිය යුතුය.

05.02. ඇමුණුම් 02 භාවිතා කර, දිස්ත්‍රික් දිවිනැගුම අංශය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගේ අත්සනින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ යොමු කල යුතුය. ඒ සඳහා bank@divineguma.gov.lk විද්‍යුත් ලිපිනය හරහා 2016.11.04 දිනට පෙර එවීම අනිවාර්ය බව දන්වමි.

**6.** දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා කඩිනමින් ඉදිරියේදී හඳුන්වා දෙනු ලබන ඇගැයීම් වැඩසටහන හා බැංකු ශ්‍රේණිගත (Grading) කිරීමේදී, මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ද ඇගැයීමට සලකා බලන බවද දන්වමි.

ඩී.ඒ.සුනන්දා පියසීලි,
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

පිටපත් :- 01. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ස.
02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
03. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
04. සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.

**ඇමුණුම - 01**

**2016 ඔක්තෝම්බර් 01 ජාතික ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ**

**ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

**.......................................... දිවිනැගුම ප්‍රජා මූල බැංකුව**

| විස්තරය | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු.) * | වෙනත් |
|---|---|---|---|
| අළුතින්ම විවෘත කරන ලද<br><br>දැනට ක්‍රියාත්මක ගිණුම් සඳහා රැස්කරන ලද | | | |
| එකතුව | | | |

* ඒ ඒ ඉලක්ක වෙනුවෙන් රැස්කරන ලද තැන්පත් මුදල සඳහන් කල යුතුය.

---

**ඇමුණුම - 02**

**2016 ඔක්තෝම්බර් 01 ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ**

**ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

**............................................. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය / දිස්ත්‍රික්කය**

| බැංකුවේ නම | අළුතින් ආරම්භ කරන ලද | | දැනට පවතින ගිණුම් සඳහා රැස්කරන ලද තැන්පතු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල(රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල(රු.) * |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

* රැස්කරන ඉහළම තැන්පතු මුදලෙහි සිට අඩුම මුදලක් රැස්කරන බැංකුව දක්වා, පෙළගස්වා වාර්තාව සකස් කල යුතුය.